උ.ප.රා.සේ.කො.සභාවේ චක්‍රලේඛ අංක 05/2021

මගේ අංකය NP/07/10/01/141
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත,
යාපනය .
22.02.2021

ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය, උතුරු පළාත.
කොමසාරිස්, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව,
උතුරු පළාත

උතුරු පළාතේ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව යටතේ පවතින සහකාර මෙට්‍රන් තනතුරේ III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ **සීමිත** තරග විභාගය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් පැවැත්වීමට නියමිත බවත් එම විභාගය සඳහා අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 12.03.2021 බවත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

- **1 වන වගුව - තනතුරු පිළිබඳ තොරතුරු :-**

| **විභාගයේ නම** | **පුරප්පාඩු සංඛ්‍යාව** | |
|---|---|---|
| | **පුරුෂ** | **ස්ත්‍රී** |
| උතුරු පළාතේ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු සේවයේ සහකාර මෙට්‍රන් තනතුරේ III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ **සීමිත** තරග විභාගය – 2021 | **01** | **01** |

**02. බඳවා ගැනීමේ සේවා කොන්දේසි :-**

02.1 උතුරු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් අනුමත සහකාර මෙට්‍රන් III වන ශ්‍රේණියට අදාල සේවා ව්‍යවස්ථා සංග්‍රහය / බඳවා ගැනීමේ පටිපාටියේ නිර්දේශ කරන ලද කොන්දේසින් හා ආයතන සංග්‍රහයේ විධිවිධානයන් ද, මුදල් රෙගුලාසීන්, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අංක 1817/30 හා 2013.07.03 වන දින දරණ අතිවිශේෂ ගැසට් නිවේදනයේ පළ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවය සඳහා වූ ආයතන පටිපාටි රීති සංග්‍රහය, ගරු ආණ්ඩුකාරවරගේ අංක **G/NPC/A5/HG/Approval/2020** හා 2020.12.18 හා දින දරණ ලිපිය යනාදියට යටත්ව තෝරා ගන්නා ලද විභාග අපේක්ෂකයන් සහකාර මෙට්‍රන් III වන ශ්‍රේණියට පත් කරනු ලැබේ.

02.2 තරග විභාගයේ III වන ශ්‍රේණියට සමත් වන විභාග අපේක්ෂකයන් පත්වීම් දින සිට වසරක(01) පරිවාස කාලයකට යටත් කොට III වන ශ්‍රේණියේ තනතුරට පත් කරනු ලැබේ. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරකි. සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් කර ඇති පරිදි උක්ත තනතුරු වල III වන ශ්‍රේණියට බඳවා ගත් දින සිට වසර තුනක (03) කාල පරිච්ඡේදය තුළ පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්විය යුතුයි.

02.3 මෙම සේවය ස්ථාන මාරුවීම්වලට යටත්වූ සේවා ගණයක් වන අතර මෙම තනතුරට පත් කරන අපේක්ෂකයන් උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවයක කළ යුතුයි යන කොන්දේසියට යටත් විය යුතු යි.

02.4 පත්වීම් සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය යනාදි කරුණු පත්වීම් බලධාරියා විසින් නිර්වචනය කරනු ලැබේ. පත්කිරීමට යෝජිත තනතුරු සංඛ්‍යාව 1 **වන වගුවේ** දක්වා ඇති පරිදි වේ. එසේ වුවද දන්වා ඇති පුරප්පාඩු සම්බන්ධයෙන් යම් පුරප්පාඩු ප්‍රමාණයක් හෝ පුරප්පාඩු සියල්ල රැණය නොකර සිටීමේ බලය පත්වීම් බලධාරියා සතු ය.

**03 වැටුප් පරිමාණ :-**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 ප්‍රකාර, නියම කොට ඇති වැටුප් කාණ්ඩ **MN 1 - 2016** ට අනුව සහකාර මෙට්‍රන් තනතුරේ III වන ශ්‍රේණිය සඳහා ඒකාබද්ධ වැටුප් ප්‍රතිශතය වනුයේ රුපියල් **27,140 – 10 x 300 - 11 x 350 - 10 x 495 – 10 x 660 – 45,540/-**කි. (රුපියල් 28,040.00 යන වැටුප් පියවරට එළඹීමට ප්‍රථම පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත් විය යුතුයි)

**04 බඳවා ගැනීමේ පරිපාටිය :-**

බලාත්මකව පවතින රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, බඳවා ගැනීමේ පටිපාටිය, ජාතික හා පළාත් ප්‍රතිපත්තීන් යනාදීන්ට යටත්ව සහකාර මේට්‍රන් තනතුරේ III වන ශ්‍රේණියට **සීමිත** තනතුරට ලිඛිත විභාගයෙන් සමත් වූ අයදුම්කරුවන් ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණයට ඡේද 12.2හි සඳහන් පරිදි ලකුණු ප්‍රදානය කරනු ලැබේ. **ලිඛිත විභාගය හා ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගනු ලබන ලකුණු ප්‍රමාණයේ එකතුව පරිදි ඉහළ ලකුණු අනුපිළිවෙළට, පවතින පුරප්පාඩු සඳහා සම්මුඛ පරීක්ෂණයට තෝරා ගනු ලැබේ.**

බලාත්මකව පවතින සමාජ සේවා නිලධර තනතුරට අදාල සේවා ව්‍යවස්ථා සංග්‍රහය, හා බඳවා ගැනීමේ පටිපාටියේ මගින් නියම කරන ලද නියෝග, ආයතන සංග්‍රහයේ විධිවිධානයන්, මුල්‍ය ප්‍රකාශන හා ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ 1817/30 වන අංකය දරණ 2013.07.03 වන දිනැති අති විශේෂ ගැසට් නිවේදනයේ පළ කරන ලද උතුරු පළාත් සේවයට අදාල ආයතන කාර්ය පටිපාටික රීති සංග්‍රහය යනාදීන් අන්තර්ගතව, තෝරා ගනු ලබන විභාග අපේක්ෂකයන් සමාජ සේවා නිලධර තනතුරේ II වන ශ්‍රේණියට පත් කරනු ලැබේ

## 05. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :-

### *05.1* අධ්‍යාපන සුදුසුකම :-

අ.පො.ස (සා/පෙ) විභාගයෙන් එකවර භාෂාව හෝ සාහිත්‍යය (දෙමළ/සිංහල/ඉංග්‍රීසි), ගණිතය, විද්‍යාව යන විෂයයන් ඇතුළුව විෂයයන් හතරකට(04) සම්මාන සාමාර්ථයන් සමග විෂයයන් හයක් 06) සමත්වී තිබිය යුතුයි.

**ඒ සමගම**

රජය විසින් අනුමත ආයතනයක මාස හයකට 06) නොඅඩු ළමාරක්ෂක හා සමාජ සේවාව සම්බන්ධ ඩිප්ලෝමා සහතිකපත් හිමිකර තිබිය යුතුයි.

### 05.2 **වෘත්තිය:-**

**උතුරු පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු සේවයේ** ස්ථිර තනතුරක් දැරිය යුතු අතර අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පෙරාතුව වසර පහක් 05 අඛණ්ඩ හා සක්‍රීය සේවා කාලයක් හිමිකර තිබිය යුතුයි එම සේවය ස්ථිර කර තිබිය යුතු අතරම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/ 2016 පරිදි PL 1 – 2016, PL 2 – 2016, යන වැටුප් කේතය යටතේ වැටුප් ලබන නිලධාරියෙකු විය යුතුයි.

### 05.3 **වයස්සීමාව** :-

සීමිත තරඟ විභාගයක් වන බැවින් වයස් සීමාව බලපාන්නේ නැත.

## 06 විභාග ගාස්තු :-

අපේක්ෂකයන් පදිංචි වී සිටින උතුරු පළාතේ පිහිටි තැපැල් කාර්යාලයක රුපියල් **500.00** ගෙවා **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත"** යන නමට යාපනය ප්‍රධාන තැපැල් කාර්යාලයෙන් මාරු කිරීමට පුළුවන් වන ආකාරයට මුදල් ඇණවුමක් ලබාගෙන අයදුම්පතේ අදාළ කොටුව තුළ නොගැළවෙන සේ අලවා එවිය යුතුයි. මොනම හේතුවක් නිසා හෝ මෙම ගාස්තු නැවත ගෙවනු නොලබන අතර මෙම ගාස්තුව වෙනත් කිසියම විභාගයක් සඳහා මාරු කිරීමට අවසර දෙනු නොලැබේ.

## 07. අයදුම්කරන ක්‍රමය:-

මෙම දැනවීම අවසානයේ ඇති ආදර්ශ අයදුම්පතට අනුකූලව A4 ප්‍රමාණයේ (21 සෙ.මී x 29 සෙ.මී) කඩදාසියක 1 සිට 4.5 දක්වා තිබෙන ඡේද පළමු පිටුවේ ද, 4.6 සිට 7 දක්වා තිබෙන ඡේද දෙවන පිටුවේ ද, ඉතිර කොටස් අනෙක් පිටුවේ ද ආවරණය වන පරිදි අයදුම්පත සකස් කර ගත යුතුයි. සම්පූර්ණ කරන ලද අයදුම්පත 12.03.2021 වැනි දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන පරිදි, **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක: 393/48, කෝවිල් වීදිය, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑල මගින් යොමු කළ යුතුයි.

07.1 අයදුම්පත්‍ර යොමු කරන ලිපිකවරයේ වම් ඉහළ කෙළවරේ **"උතුරු පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු සේවයේ සහකාර මේට්‍රන් තනතුරේ III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය – 2021** යනුවෙන් සඳහන් කළ යුතුයි

07.3 අයදුම්පතේ ඡායා පිටපත ඔබ බාරයේ තබා ගැනීම ප්‍රයෝජනවත් වන අතර අයදුම්පතේ ඡායා පිටපත් හෝ පූර්ව නිශ්චිත පිටපත් යනාදීන් භාරගනු නොලැබේ. විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍ර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් නිකුත් කරනු ලැබේ. **විභාගය සඳහා ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම යනු අයදුම්කරු විසින් සියළුම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් සේ නොසැළකිය යුතුය.**

07.4 අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුමකරුවන්ට ප්‍රවේශපත් නිකුත් කළ පසු ඒ පිළිබඳව පුවත්පත් මගින් දැන්වීමක් නිකුත් කරනු ලැබේ. දැන්වීම පළවූ පසු යම්කිසි අපේක්ෂකයකුට අවම වශයෙන් විභාගය පැවැත්වීමට නියමිත දින තුනකට (03) ප්‍රථම හෝ ප්‍රවේශ පත්‍ර ලැබුණේ නැතිනම්, ඒ පිළිබඳ පහත සඳහන් තොරතුරු සමග, **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක: 393/48, කෝවිල් වීදිය, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට දැන්වීමට කටයුතු කළ යුතුයි. (දුරකථන අංකය - 021 221 9939, ෆැක්ස් අංක - 021 221 9940

**ඉදිරිපත් කළ යුතු විස්තර :-**
**විස්තර සඳහන් ලිපියක්, අයදුම්පත්‍රයේ ඡායා පිටපතක්, විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සියේ පිටපතක්, ප්‍රවේශපත්‍ර යොමු කිරීමට අවශ්‍ය ෆැක්ස් අංකයක්.**

## *08.* . අනන්‍යතාවය තහවුරු කිරීම :-

විභාග අපේක්ෂකයන් තමන් පෙනී සිටින සෑම විෂයන්ටම විභාග ශාලාධිපති තෘප්තිමත් වන පරිදි තම අනන්‍යතාවය තහවුරු කළ යුතු බව ඉල්ලා සිටිනු ලැබේ. අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් කුමක් හෝ එක් ලියවිල්ලක් පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම් පත
(ii) වලංගු ශ්‍රී ලංකා ගුවන් ගමන් බලපත්‍රය.
(iii) රියදුරු බලපත්‍රය

ඉහත සඳහන් කරන ලද ලියවිල්ලක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන විභාග අපේක්ෂකයෙකුට විභාගය සඳහා පෙනී සිටීමේ හිමිකම **ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත,** ගේ අභිමතය පරිදි ප්‍රතික්ෂේප කළ හැකිය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයන් නැඹුරු විය යුතුයි.

## 09. අසත්‍ය තොරතුරු සඳහා අඩුවම :-

අයදුම්පත් සම්පූර්ණ කරන විට වැඩි අවධානයකින් යුතුව සත්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමට වගබලා ගත යුතුයි. මෙම විභාග නීතිරීති ප්‍රකාර කිසියම් අපේක්ෂකයෙකු විභාගයට ප්‍රථම හෝ විභාගය පැවැත්වෙන විට හෝ විභාගයෙන් පසුව කුමණ අවස්ථාවකදී හෝ වුව ද සුදුසුකම් සම්පූර්ණ කර නැති බවට අනාවරණය වන්නේ නම්, එම අපේක්ෂකයාගේ විභාගයට පෙනී සිටීමේ හිමිකම වහාම ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්කරු විසින් ඉදිරිපත් කර ඇති යම්කිසි තොරතුරක් අසත්‍ය බවට ඔප්පු වුවහොත් ඕනෑම අවස්ථාවක එම පුද්ගලයා පළාත් රාජ්‍ය සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ඇත.

## 10. විභාගය පරිපාටිය :-

### 12.1 ලිඛිත විභාගය

මෙම විභාගයට පහත සඳහන් පරිදි ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. දෙමළ මාධ්‍යය මගින් පැවැත්වෙන මෙම විභාගයට සුදුසුකම් සපුරා ඇති සිංහල භාෂා මාධ්‍යයෙන් ද අයදුම්පත්‍ර ලැබෙන විට සිංහල භාෂා මාධ්‍යයෙන් ද මෙම විභාගය පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. අයදුම් කළ භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අවස්ථාව දෙනු නොලැබේ.

| *අංකය* | *ප්‍රශ්න පත්‍ර* | *විෂය මාලාව* | *කාලය* | *ලකුණු* |
|---|---|---|---|---|

| | | | | |
|---|---|---|---|---|
| 01 | භාෂණ හැකියාව හා සාමාන්‍ය දැනුම | **භාෂණ හැකියාව :-**<br>කෙටියෙන් ලිවීම, අවබෝධය, වැරදි හඳුනා ගැනීම, පහසු ව්‍යාකරණ භාවිතය යන කරුණු කෙරෙහි අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කරනු වස් ප්‍රශ්න අඩංගු වන ප්‍රශ්න පත්‍රයකි<br>**සාමාන්‍ය දැනුම :-**<br>තනතුර ආශ්‍රිත විෂයන් හා කරුණු පරීක්ෂා කිරීම සඳහා සකස් කරනු ලබන ප්‍රශ්න පත්‍රයකි. | පැය 01 | 100 |
| 02 | අභියෝග්‍යතා පරීක්ෂණය | මෙම ප්‍රශ්න පත්‍රය අංක ගණිතය, තර්කානුකූල හැකියා හා සාමාන්‍ය බුද්ධිය සම්බන්ධයෙන් අයදුම්කරුගේ දැනුම මැනීමට සකස් කරන ප්‍රශ්න පත්‍රයකි. | පැය 01 | 100 |

මෙම විභාගයෙන් සමත්වීමට එක් එක් විෂයයන් සඳහාම ලකුණු 40% ක් ලබාගත යුතුයි

12.2 **ව්‍යුහමය සම්මුඛ පරීක්ෂණය :-**

ව්‍යුහමය සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් විෂයයන් සම්බන්ධයෙන් ලකුණු ප්‍රදානය කරනු ලැබේ. (**සම්පූර්ණ ලකුණු ප්‍රමාණය** 100)

| *අංක* | **ලකුණු ප්‍රදානය කරන විෂයය පථයන්** | *ලකුණු* | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 01 | **වෘත්තීය අත්දැකීම්** | වසරකට ලකුණු පහ(05) බැගින් අවුරුද්දකට අඩු නමුත් මාස හයකට හෝ මසය හයකට වැඩි කාලපරිච්ඡේදයට ලකුණු **දෙක** (02) බැගින් ප්‍රදානය කරනු ලැබේ. | 50 |
| 02 | **වෙනත් සුදුසුකම්** | අදාළ ක්ෂේත්‍රයේ සහතිකපත් පාඨමාලාව සම්පූර්ණ කර තිබීම සඳහා ලකුණු - 15 ක්<br>අදාළ ක්ෂේත්‍රයේ ඩිප්ලෝමා පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම ලකුණු - 35 | 50 |
| සම්පූර්ණ ලකුණු | | | 100 |

මෙම විභාගයේ සෑම විෂයයන්ටම අවම වශයෙන් ලකුණු **හතළිහ ප්‍රතිශතයක්** (40%) විභාග අපේක්ෂකයන් ලබා ගත යුතු අතර අවම වශයෙන් **සමත්වීම** සඳහා ලකුණු 50 **ක්** ලබා ගතයුතුයි.

## 13. විභාග ප්‍රතිඵල :-

විභාග අපේක්ෂකයන් සඳහා විභාග ප්‍රතිඵල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් www.np.gov.lk යන උතුරු පළාත් සභා අන්තර්ජාලය මගින් නිකුත් කරනු ලැබේ. පසුව විභාගයට පෙනී සිටි විභාග අපේක්ෂකයන් සියල්ලන්ටම තැපැල් මගින් යොමු කරනු ලැබේ.

14. මෙම විභාගය පැවැත්වීම හෝ අවලංගු කිරීම සම්බන්ධයෙන් වූ බලය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් සතුය. මෙම නිවේදනයේ දෙමළ හා සිංහල යන භාෂා මාධ්‍යයන් අතර යම් කිසි අනනුකූලතාවයක් පැන නගින අවස්ථාවක දී දෙමළ මාධ්‍යයේ නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

***එස්. තිරුවාකරන්***
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු පළාත්.
22.02.2021